00257

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව 4 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2022/2023
LLU4806/LWU2312 -අපරාධ නීතිය
කාලය - පැය එක (01) යි.

---

දිනය - 2023.12.02 වේලාව - පෙ.ව.11.30 - ප.ව.12.30 දක්වා

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 02 යි.
එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයින්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. කිරිල්ලවෙල නම් කුඩා ගම්මානයේ හදිසියේ ඇති වූ ලැව් ගින්නක් හේතුවෙන් අවට කුඹුරු දැඩිලෙස දැවී ගියේය. ගින්න මැඩපැවැත්වීමට උත්සාහ ගත් සමන් නැමති ගොවි මහතා විසින් ඒ අවට තිබූ, ව්‍යවස්ථාපිතව ආරක්ෂා කරන ලද ගස් කිහිපයක් කපා දැමුවේ ය. අදාල රාජ්‍ය නිලධාරීන්ගේ අනුමැතියෙන් තොරව ගස් කැපීම නීති විරෝධී වූ බැවින් ප්‍රදේශයේ ගම්වාසීන් සමන් ව දැඩි ලෙස විවේචනය කරන ලදී. ඔවුන් ළඟම තිබූ පොලිස් ස්ථානයට ගොස් සමන්ට විරුද්ධව පැමිණිල්ලක් ගොනු කරන ලදී.

ඒ අතරතුර, අජිත් නැමැති තවත් ගොවිමහතෙක් සමන් වෙතට දිවගොස්, නීති විරෝධී ව මෙම වටිනා ගස් කපා දැමුවේ ඇයිදැයි විමසමින් ඔහු සමඟ වාද කළේ ය. එම අවස්ථාවේ, අජිත්, පාර අයිනේ තිබූ මුගුරක් රැගෙන සමන් ට මරණ තර්ජනය කළේ ය. එවිට සමන් විසින් අජිත් ව පසෙකට තල්ලු කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුගේ හිස බිම වැදී දරුණු තුවාල සිදු විය.

ඉහත සිද්ධිමය සාධක ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අ) ව්‍යවස්ථාපිතව ආරක්ෂා කරන ලද ගස් නීති විරෝධීව කපා දැමීම පිළිබඳ ව සමන්ට එරෙහිව පවතින චෝදනාවේ දී සාපරාධී වගකීමෙන් නිදහස් වීම පිණිස ඔහුට යොදාගත හැකි වඩාත් සුදුසු විත්තිවාචකය කුමක් ද? සාකච්ඡා කරන්න.

ආ) අජිත්ට තුවාල සිදු කිරීම පිළිබඳ චෝදනාවේ දී සාපරාධී වගකීමෙන් නිදහස්වීමට සමන්ට භාවිතා කළ හැකි වඩාත් සුදුසු විත්තිවාචකය කුමක් ද? සාකච්ඡා කරන්න.

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි.)

02. වසර කිහිපයකට ඉහත දී නිරෝෂා සහ චන්න අතර ප්‍රේම සම්බන්ධයක් පැවතුනි. එක් වැසිබර දිනයක, නගරයේ හුදෙකලා ස්ථානයක දී, අනපේක්ෂිත ලෙස නිරෝෂා ට චන්න මුණ ගැසුණි. ඔවුන්ගේ ප්‍රේම සම්බන්ධය පැවති කාලයේ ඔහු විසින් ඇය වෙත තෑගි කළ රන් ආභරණ ආපසු දෙන ලෙස චන්න ඇයගෙන් දැඩි ලෙස ඉල්ලා සිටියේ ය. එම රන් ආභරණ මිල දී ගැනීමට වැය කළේ තමාගේ ම මුදල් බව කියමින් නිරෝෂා චන්න සමග වාද කළා ය. එවිට චන්න අසභ්‍ය වචනයෙන් ඇයට බැණ වදිමින් ඇයව මරා දවන බවට තර්ජනය කළේ ය. අනතුරුව, චන්න නිරෝෂා ව වීදියේ කෙළවරකට ඇදගෙන ගොස් ඇය පැළඳ සිටි රන් මාලය උදුරාගෙන පැන දිව්වේ ය. නිරෝෂා සිද්ධිය පිළිබඳව ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත පැමිණිලි කළා ය.

ඉහත සිද්ධිය ඇසුරින් චන්න ගේ සාවද්‍ය භාවය සාකච්ඡා කරන්න. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20යි.)

හිමිකම් ඇවිරිණි.